**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේවිධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී,වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ දී, මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ඇණවුම් කිරීමකින් හා භාණ්ඩ ලැබීමකින් තොරව රු.2,002,117 ක මුදලක් සැපයුම්කරුට ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, වර්ෂයේ වියදම් හා ණයහිමි ශේෂය මූල්‍ය ප්‍රකාශනවල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | ඇණවුම් කර භාණ්ඩ ලබා ගැනීමට කටයුතු කරන බව | වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාග්ධන වියදම හා ණයහිමි ශේෂය රු.2,010,000 වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මිල ගණන් කැඳවා ඇති බැවින්, ණයහිමියන්ලෙස සටහන් කර ඇත | ප්‍රාග්ධන වියදම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට කාර්යාල ගොඩනැගිල්ල නවීකරණය සඳහා දරන ලද වියදම රු.709,610 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කරන බව | වර්ෂයේ ගොඩනැගිලි සංවර්ධන පිරිවැය නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට කළුගල්හින්න ජල යෝජනා ක්‍රමයේ වටිනාකම රු.3,000,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කරන බව | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය |

1.6.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.271,307 ක විවිධ තැන්පත් ශේෂය ඊට අදාළ උපලේඛනය විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේ දී,සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | තවදුරටත් පරීක්ෂා කර ප්‍රගතිය දැනුම් දීමට කටයුතු කරන බව | ශේෂ සනාථ කිරීමට අවශ්‍ය ලේඛනගත සාක්ෂි පවත්වා ගත යුතුය |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව,2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,750,304 ක් වූ අතර,ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,750,628 ක්විය.

2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | සමාලෝචිත වර්ෂයඅවසානයට අය විය යුතු රු.980,293 ක වරිපනම් බදු අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ වසර 05 කට වැඩි කාලයක සිට ඒකකයක හිඟය රු.1,000 ට වැඩි දේපළ 115 කට අදාළව අය විය යුතු රු.407,312 ක් අයිතිකරු නිශ්චිතව හඳුනා නොගත් දේපළ 75 කට අදාළව අය විය යුතු රු.66,807 ක් ඇතුළත්ව තිබුණි. | 2022 මැයි 31 දින වන විට කොටසක් අය කර ඇති බව හා හිඟ ශේෂ ඉදිරියේ දි අය කරන බව | හිඟ වරිපනම් බදු මුදල් අය කළ යුතුය |
| (ආ) | ජල බදු | | |
| | සභාව සතු ජල ව්‍යාපෘති 17 ක පාරිභෝගිකයින් 180 දෙනෙකුගෙන් වසර 03 කට වඩා වැඩි කාලයක සිට හිඟව පවතින රු.1,365,566 ක ජල ගාස්තු අය කර නොතිබුණි. | හිඟයෙන් කොටසක් අය කර ගෙන ඇති බව | හිඟ ජල ගාස්තු අය කළ යුතුය |
| (ඇ) | ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු රු.481,900 ක් අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ වසර 05 කට වැඩි කාලයක සිට ත්‍රීරෝද රථ 38 කට අදාළව අය විය යුතු රු.320,000 ක් ඇතුළත්ව තිබුණි. | සමීක්ෂණයක් සිදු කර හිඟ ගාස්තු අය කිරීමට කටයුතු කරන බව | හිඟ ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු අය කළ යුතුය |

(ඇ) බිම් කුලී

----------

| | | |
|---|---|---|
| සභාව සතු සිල්වාස්ලැන්ඩ්ස් ඉඩමේ බිම් කොටස් 18 ක් බදු දීමේ දී, 2018 නව තක්සේරුව මත ගිවිසුම් අත්සන් කර නොතිබුණු අතර, මෙම බිම් කොටස්වලට අදාළව අය විය යුතු රු.107,845 ක හිඟ බිම් කුළී ආදායම් අය කර නොතිබුණි. | වර්තමානය වන විට කොටසක් අය කර ඇති බව | නව තක්සේරුව මත ගිවිසුම්ගත වී හිඟ බිම් කුළී අය කිරීමට කටයුතු කළ යුතුය |

(ඉ) දැන්වීම් පුවරු ගාස්තු

-----------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට බල ප්‍රදේශයේ ස්ථාපනය කර තිබුණු දැන්වීම් පුවරු 15 කට අදාළව අය විය යුතු රු.285,743 ක මුදලක් අය කර නොතිබුණි. | වර්තමානය වන විට කොටසක් අය කර ඇති බව | දැන්වීම් පුවරු ආදායම් අය කර ගත යුතුය |

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1 හඳුනාගත් පාඩු

-----------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 වර්ෂයේ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.468,780 ක ප්‍රතිපාදන උපයෝජනය කර බ්‍රෝහිල් වත්තට අයත් තිබොරොන්වා කොටසේ ක්‍රීඩා පිටිය ඉදිකිරීමේ දී, ඉඩමේ අයිතිය නිවැරදිව තහවුරු කර ගෙන නොතිබූ නිසා, සභාව විත්තිකරු ලෙස නම් කර කොළඹ දිසා අධිකරණයේ පනවා තිබුණු නඩුව සඳහා 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දිනය දක්වා රු.818,500 ක නඩු ගාස්තු සහා අරමුදලින් ගෙවා තිබුණු අතර, නඩු කටයුතු ද අවසන් වී නොතිබුණි. | නඩුවේ පැමිණිලිකරු විසින් සභාව ඇතුළු පාර්ශව කිහිපයක් විත්තිකරුවන් ලෙස නම් කර තිබීම හේතුවෙන්, සභාවට මෙම නඩුව වෙනුවෙන් පෙනී සිටීමට සිදු වූ බව | ඉඩම්වල අයිතිය තහවුරු කර ගෙන සංවර්ධන වැඩ ආරම්භ කළ යුතුය |

(ආ) සභාවට අය විය යුතු මුදල් අය කර නොගැනීම

---------------------------------------------------

| | | |
|---|---|---|
| සභාවේ 1998, 1999 හා 2000 වසරවල දී, ලේකම් ලෙස සේවය කරන ලද නිලධාරියා විසින් කරන ලද මූල්‍ය වංචාව රු.762,322 ක් හා ඔහු විසින් ලබා ගන්නා ලද රු.32,227 ක සේවක ණය මුදල සමඟ එකතුව රු.794,549 ක මුලු මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද අය කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104(3) ප්‍රාරම්භක පරීක්ෂණ සිදු කරන බව | අදාළ පරීක්ෂණ පවත්වා වංචා කර ඇති මුදල් අය කර ගත යුතුය |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවසතුජලයෝජනාක්‍රම 10 ක ජල මනු සවිකරඇතිමුලු ජල පාරිභෝගිකයින් 1,778 ක් අතුරින් ජල පාරිභෝගිකයින් 424 දෙනෙකු සඳහා සවි කර තිබූ ජල මනු අක්‍රීය බව වාර්තා කර තිබුණ ද, එය නිවැරදි කිරීමට ක්‍රියා නොකර, එම පාරිභෝගිකයින්ගෙන් මාසික ස්ථාවර ගාස්තුවක් අය කර තිබුණි. | අක්‍රීය මනු යථා තත්ත්වයට පත් කර මනු කියවීම සටහන් කර ඒ අනුව මුදල් අය කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ජල මනු සවි කර භාවිතය අනුව ජල ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය |